# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## විෂය නිර්දේශය

## 12-13 ශ්‍රේණි

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

12, 13 ශ්‍රේණි

විෂය නිර්දේශය

© ජාතික අධ්‍යාපන ආයතනය

සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය,
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් ලිපිනය : info@nie.lk

# පටුන


| | |
|---|---|
| පෙරවදන | 2 |
| හැඳින්වීම | 3 - 4 |
| ජාතික පොදු අරමුණු | 5 |
| මූලික නිපුණතා | 6 - 7 |
| විෂය අරමුණු | 8 |
| ජාතික පොදු අරමුණු සහ විෂය අරමුණු අතර සම්බන්ධතාව | 9 |
| පාසල් වාර සැලැස්ම | 10 |
| විෂය නිර්දේශය | 11 - 35 |
| පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන් | 36 |
| ඇගයීම හා තක්සේරුකරණය | 37 |
| විෂය නිර්දේශ සම්පාදක මණ්ඩලය | 38 |

# පෙරවදන

ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාවේ අ.පො.ස. උසස් පෙළ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය ධාරාව සඳහා මෙම විෂය නිර්දේශය සම්පාදනය කර ඇත. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය යටතේ මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක වන්නේ 2018 වර්ෂයේ දී ය.

මෙම විෂය නිර්දේශය සම්පාදනය කිරීමේ දී දේශීය හා විදේශීය වශයෙන් සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති විෂය නිර්දේශ අධ්‍යයනය කරන ලදි. යුනෙස්කෝ සංවිධානය විසින් 1982 වසරේ දී ගෲන්වල්ට් ප්‍රකාශනය එළිදක්වමින් මාධ්‍ය අධ්‍යාපනය ලබා දිය යුතු බවට කළ නිර්දේශය හා 2007 වසරේ පැරිස් න්‍යාය පත්‍රය මඟින් තරුණ පරපුර වෙත මාධ්‍ය අධ්‍යාපනය ලබා දීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ කරුණු මෙහි දී මාර්ග දර්ශනයක් ලෙස අවධානයට ගනු ලැබිණ.

අ.පො.ස. උසස් පෙළ විභාගය අවසානයේ ශිෂ්‍යයා තෝරා ගන්නා කුමන මාර්ගයක, හෝ එනම් උසස් අධ්‍යාපනය ලැබීම හෝ වෘත්තීය අධ්‍යාපනය කෙරෙහි යොමු වීම යන ඕනෑ ම අවස්ථාවක දී සාර්ථක සන්නිවේදකයෙකු ලෙස කටයුතු කිරීමටත් ජීවිත කාලය පුරා ඵලදයී හා වගකීම් සහගත පුරවැසියෙකු ලෙස කටයුතු කිරීමටත් අවශ්‍ය න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම, කුසලතා, ආකල්ප හා පුරුදු වර්ධනය කිරීමෙන් චර්යාමය වෙනසක් ඇති කිරීමට මෙම විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම් හා විෂය අන්තර්ගතය පෙළ ගස්වා ඇත.

මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම ඇතුළත් ගුරු මාර්ගෝපදේශ දෙකක් 12 හා 13 ශ්‍රේණි සඳහා හඳුන්වා දීමට නියමිත ය. ඒ අනුව සාර්ථක ව විභාගයට මුහුණ දී විභාගය සමත් වීමටත් යහපත් පුරවැසියෙකු ලෙස ජීවිතය සමත් වීමටත් මෙම විෂය නිර්දේශයෙන් අත්වැලක් සැපයෙනු ඇතැ යි අපි විශ්වාස කරමු.

# හැඳින්වීම

සන්නිවේදනය අත්‍යවශ්‍ය මානවීය ක්‍රියාවලියකි. අදහස්, තොරතුරු, දැනුම ආදිය හුවමාරු කර ගැනීම යන්න සන්නිවේදනයේ සරල අර්ථය යි. තොරතුරු හුවමාරු කර ගැනීමෙන් තොර ව පුද්ගලයෙකුට ජීවත්විය නොහැකි ය. ඒ තරමට ම සන්නිවේදනය අත්‍යවශ්‍ය මානව අන්තර්සම්බන්ධතා ගොඩනගන සාධකය වී තිබේ. සරල සංඥා සංකේතවලින් ආරම්භ වූ මානව සන්නිවේදන ක්‍රියාවලිය වර්තමානය වන විට දියුණු සන්නිවේදන තාක්ෂණ මෙවලම් ඔස්සේ අතිශය සංකීර්ණත්වයට පත් ව ඇත. අසීමාන්තික ව ගලා එන තොරතුරු ප්‍රවාහයන් හමුවේ පුද්ගලයා තමාට අවශ්‍ය හා අදාළ තොරතුරු තෝරා ගැනීම සම්බන්ධයෙන් ව්‍යාකූලත්වයට පත් ව සිටියි.

දරුවෝ ද තරුණ පරපුර ද අසීමාන්තික තොරතුරු ප්‍රවාහයන් හමුවේ කුමක් තෝරාගත යුතු ද යන්න පිළිබඳ අතීරණයට පත් ව සිටිති. මාධ්‍ය දරුවන් හා තරුණ පිරිස් වෙත අහිතකර ලෙස බලපා ඇති බව හා ඔවුන් ඒවායේ ගොදුරු බවට පත්වන බව ලෝකයේ විද්වත් පර්යේෂකයන් විසින් සිදු කරන ලද පර්යේෂණ අධ්‍යයන මගින් පෙන්වා දී ඇත. මේ සඳහා ප්‍රතිකර්මය දරුවන් සන්නිවේදන මාධ්‍ය මෙවලම් පරිහරණය කිරීමෙන් වළකා තැබීම නො වේ. ඒ වෙනුවට කළ යුතු වන්නේ ඔවුන් විචාරශීලී ව තොරතුරු පරිහරණය කිරීමට අවශ්‍ය දැනුමෙන් සන්නද්ධ කිරීම යි. සන්නිවේදන මෙවලම් හමුවේ දරුවන් හුදෙකලා අක්‍රිය තනි ඒකක බවට පත් කිරීම වෙනුවට මාධ්‍ය සාක්ෂරතාවෙන් යුතු සක්‍රිය පුරවැසියන් කිරීම අරමුණු කොට ගෙන මෙම විෂය නිර්දේශයෙහි මාතෘකා තෝරා ගෙන ඇත. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය පිළිබඳ මූලික සංකල්පයන්ගේ සිට අනුක්‍රමයෙන් ගැඹුරු වන ආකාරයෙන් සහ දරුවන්ගේ බුද්ධි මට්ටමට සුදුසු වන ආකාරයෙන් විෂය අන්තර්ගතය පෙළ ගස්වා ඇත.

මෙම විෂය සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වේ. මෙහි ඇතුළත් විෂය මාතෘකා අධ්‍යයනය කිරීමෙන් ශිෂ්‍යයා අත්පත් කර ගනු ලබන කුසලතා ශිෂ්‍ය පැතිකඩ මගින් ඉදිරිපත් කෙරේ.

## අ.පො.ස (උසස් පෙළ) සන්නිවේදනය හා මාධ්‍ය විෂය හදාරන ශිෂ්‍යයා අත්පත් කර ගනු ලබන කුසලතා

### සන්නිවේදනය (Communication)

- යහපත් සන්නිවේදකයෙකු වීම
- භාෂාව මැනවින් හැසිරවීම
- නිර්මාණශීලී බව
- සුහදශීලිත්වයෙන් කටයුතු කිරීම
- සමබර පෞරුෂයකින් යුක්ත වීම
- නායකත්ව ගුණාංග වර්ධනය
- සාමූහික ව කටයුතු කළ හැකි බව
- මනා සංවිධාන ශක්තියකින් යුක්ත අයෙකු වීම
- වෘත්තීය, නායකත්ව, සන්නිවේදන කුසලතා ඇති අයෙකු වීම
- සංස්කෘතික විවිධතා පිළිබඳ අවබෝධයක් ඇති අයෙකු වීම
- සහජීවනයෙන් යුතු ව කටයුතු කිරීමට හැකි වීම
- ඉදිරි දැක්මකින් යුක්ත අයෙකු වීම
- ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන පුරවැසියෙකු වීම
- රටේ සංවර්ධනයට දායක වීම

### ශිෂ්‍ය පැතිකඩ

### පොදු කරුණු

1. සන්නිවේදන කුසලතා
2. මාධ්‍ය සාක්ෂරතාව
3. විචාරශීලීත්වය
4. භාෂා භාවිතය
5. සංස්කෘතිය
6. බලපෑම
7. තොරතුරු පරිහරණය
8. සංවර්ධනය
9. නියාමනය
10. ප්‍රජාතන්ත්‍රවාදය

### මාධ්‍ය අධ්‍යයනය (Media Studies)

- විවිධ මාධ්‍ය හා ඒවාහි ස්වභාවය හඳුනා ගැනීම
- විවිධ මාධ්‍ය අතර අන්තර්සම්බන්ධතාව හඳුනා ගත හැකි අයෙකු වීම
- මාධ්‍ය අන්තර්ගතය වටහා ගන්නෙකු වීම
- මාධ්‍ය භාෂාව පිළිබඳ අවබෝධය
- මාධ්‍ය සන්දේශ විශ්ලේෂණය කර ගත හැකි වීම
- මාධ්‍ය බලපෑම් පිළිබඳ අවබෝධයෙන් යුක්ත අයෙකු වීම
- සංස්කෘතිය කෙරෙහි මාධ්‍ය බලපෑම පිළිබඳ අවබෝධය
- මාධ්‍ය ප්‍රමිතීන් පිළිබඳ අවබෝධය (ආචාර ධර්ම, ප්‍රතිපත්ති ආදිය)
- සරල මාධ්‍ය සන්දේශයක් සකස් කර ගැනීමේ හැකියාව
- මාධ්‍ය සංවර්ධනයට දයක වීම

මේ අනුව නව දැක්මකින් යුතු ව සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය හැදෑරීමටත් ඒ මඟින් සාර්ථක සන්නිවේදකයෙකු ලෙස ජාත්‍යන්තරයට පා තැබිය හැකි ශක්තිමත් සමබර පෞරුෂයකින් යුත් පුරවැසියෙකු ලෙස වර්ධනය වීමටත් අවශ්‍ය මඟ පෙන්වීම මෙම විෂය නිර්දේශයෙන් සිදු වනු ඇත.

# ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මඟින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරණු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවය, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වග වීම ඇතුලු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුශලතා පෝෂණය කිරීම (උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ලඟාකර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා:
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුශලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවි ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුශලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුශලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුශලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මළල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම. ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයයේ අරමුණු

1. සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයෙහි ආරම්භය, වර්ධනය, ශාස්ත්‍රීය පසුබිම හා ප්‍රවණතා පිළිබඳ අවබෝධය ලබා ගැනීම
2. විචාරශීලී ව මාධ්‍ය පරිහරණය කිරීමට අවශ්‍ය මාධ්‍ය සාක්ෂරතා ඥානය ශිෂ්‍යයන් තුළ වර්ධනය කිරීම
3. න්‍යායාත්මක හා ප්‍රායෝගික විෂය කරුණු සිය ජීවිත චර්යාවෙන් ම පෙන්නුම් කරමින් සාර්ථක සන්නිවේදකයෙකු බවට පත් වීම
4. සාර්ථක සන්නිවේදනයක් මඟින් යහපත් වූ පුද්ගල අන්තර්සම්බන්ධතා පවත්වා ගත හැකි සහජීවනය අගය කරන සමාජීය සත්ත්වයෙකු බවට පත් වීම
5. නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට සැමට ඇති අයිතිය හා එහි සීමාවන්ට ගරු කරන ප්‍රජාතන්ත්‍රවාදි පුරවැසියෙකු වීම
6. ජාතික ජාත්‍යන්තර තලයන්හි මාධ්‍ය ප්‍රවණතා හා සුවිශේෂතා පිළිබඳ අවබෝධයෙන් යුතු ව අනාගතයට මුහුණ දීමේ ශක්තිය හා නිපුණතා වර්ධනය කර ගැනීම
7. නිර්මාණශීලී ව මාධ්‍ය සන්දේශ සම්පාදනය කිරීමේ හා සන්නිවේදනයේ යෙදීමේ හැකියාව ලබා ගැනීම
8. ජාතික සංවර්ධනය උදෙසා සන්නිවේදනයේ කාර්යභාරය හඳුනා ගත් එයට සක්‍රිය ව දායකත්වය ලබා දෙන පුරවැසියෙකු වීම

# ජාතික පොදු අරමුණු හා විෂය අරමුණු අතර සම්බන්ධතාව

| විෂය අරමුණු | ජාතික පොදු අරමුණු | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | i. | ii. | iii. | iv. | v. | vi. | vii. | viii. |
| 1. සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයෙහි ආරම්භය, වර්ධනය, ශාස්ත්‍රීය පසුබිම හා ප්‍රවණතා පිළිබඳ අවබෝධය ලබා ගැනීම | ✓ | ✓ | | ✓ | | | ✓ | ✓ |
| 2. විචාරශීලී ව මාධ්‍ය පරිහරණය කිරීමට අවශ්‍ය මාධ්‍ය සාක්ෂරතා ඥානය ශිෂ්‍යයන් තුළ වර්ධනය කිරීම | ✓ | ✓ | ✓ | | ✓ | | | |
| 3. න්‍යායාත්මක හා ප්‍රායෝගික විෂය කරුණු සිය ජීවිත චර්යාවෙන් ම පෙන්නුම් කරමින් සාර්ථක සන්නිවේදකයෙකු බවට පත් වීම | | ✓ | | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 4. සාර්ථක සන්නිවේදනයක් මඟින් යහපත් වූ පුද්ගල අන්තර්සම්බන්ධතා පවත්වා ගත හැකි සහජීවනය අගය කරන සමාජීය සත්ත්වයෙකු බවට පත් වීම | ✓ | ✓ | ✓ | ✓ | | | ✓ | ✓ |
| 5. නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට සැමට ඇති අයිතිය හා එහි සීමාවන්ට ගරු කරන ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු වීම | ✓ | | ✓ | | | | ✓ | ✓ |
| 6. ජාතික ජාත්‍යන්තර තලයන්හි මාධ්‍ය ප්‍රවණතා හා සුවිශේෂතා පිළිබඳ අවබෝධයෙන් යුතු ව අනාගතයට මුහුණ දීමේ ශක්තිය හා නිපුණතා වර්ධනය කර ගැනීම | | ✓ | | | | ✓ | ✓ | ✓ |
| 7. නිර්මාණශීලී ව මාධ්‍ය සන්දේශ සම්පාදනය කිරීමේ හා සන්නිවේදනයේ යෙදීමේ හැකියාව ලබා ගැනීම | ✓ | | ✓ | ✓ | ✓ | | | |
| 8. ජාතික සංවර්ධනය උදෙසා සන්නිවේදනයේ කාර්යභාරය හඳුනා ගත් එයට සක්‍රිය ව දායකත්වය ලබා දෙන පුරවැසියෙකු වීම | ✓ | | | | ✓ | ✓ | | ✓ |

## විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම | කාලච්ඡේද |
|---|---|---|---|
| 12 | I | 1.1, 1.2, 1.3, 2.1, 2.2, 2.3, 2.4, 2.5 | 100 |
| | II | 3.1, 3.2, 3.3, 4.1, 4.2, 4.3, 4.4 | 110 |
| | III | 5.1, 5.2, 5.3, 6.1, 6.2, 6.3 | 120 |
| 13 | I | 7.1, 7.2, 7.3, 8.1, 8.2, 8.3, 8.4, 8.5, 8.6, 8.7 | 100 |
| | II | 9.1, 9.2, 9.3, 9.4, 10.1, 10.2, 10.3 | 100 |
| | III | 11.1, 11.2, 11.3, 12.1, 12.2 | 70 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය, විකාශය, එහි ශාස්ත්‍රීය පසුබිම හා ඉගෙනීමෙහි වැදගත්කම පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි. | | 1. **සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය හා විකාශය** | | |
| | 1.1 ශාස්ත්‍රීය විෂයයක් ලෙස සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය, විකාශය හා ඉගෙනීමෙහි වැදගත්කම හඳුනා ගෙන ඉදිරිපත් කරයි. | • සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය<br>• සන්නිවේදන අධ්‍යයනයෙහි විකාශය<br>• සන්නිවේදන අධ්‍යයනයෙහි වැදගත්කම | • ශාස්ත්‍රීය විෂයයක් ලෙස සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය පිළිබඳ පැහැදිලි කරයි.<br>• සන්නිවේදන අධ්‍යයනයෙහි විකාශය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.<br>• සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයයක් ලෙස හැදෑරීමේ වැදගත්කම පැහැදිලි කරයි. | 05 |
| | 1.2 ශ්‍රී ලංකාවට සන්නිවේදනය විෂයය හඳුන්වා දීම හා එයට පසුබිම් වූ සාධක පිළිබඳ අවබෝධය ලබයි. | • ශ්‍රී ලංකාවට සන්නිවේදන අධ්‍යයනය හඳුන්වා දීම | • ශ්‍රී ලංකාවට සන්නිවේදන අධ්‍යයනය හඳුන්වා දීම පිළිබඳ විස්තර කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.3 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය ශාස්ත්‍රීය විෂයයක් ලෙස ඉගෙනීමෙහි අවශ්‍යතාව පැහැදිලි කරයි. | • සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හඳුනා ගැනීම<br>• සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හැදෑරීමේ අවශ්‍යතාව | • සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හඳුන්වා දෙයි.<br>• සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය හැදෑරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 සන්නිවේදනය, එහි ස්වභාවය, මූලිකාංග හා කාර්ය භාරය පිළිබඳ විමර්ශනශීලී අවබෝධයෙන් යුතු ව එදිනෙදා ජීවිතයේ සන්නිවේදන කාර්ය සාර්ථක කර ගැනීමේ දී භාවිත කරයි. | 2.1 සන්නිවේදනය යන්න හඳුන්වා දෙයි. | **2. සන්නිවේදන පදනම**<br>• සන්නිවේදනය හඳුනා ගැනීම | • සන්නිවේදනය යන්න හඳුනා ගෙන අර්ථය පැහැදිලි කරයි. | 04 |
| | 2.2 සන්නිවේදනයෙහි ස්වභාවය අවබෝධයෙන් යුතු ව පැහැදිලි කරයි. | • සන්නිවේදනයේ ස්වභාවය<br>- අරමුණු සහිත බව<br>- සංකේතාත්මක බව<br>- සන්දර්භානුගත බව<br>- ක්‍රියාපටිපාටියක් බව<br>- විවිධාකාර බව<br>- බලයක් බව | • සන්නිවේදනයෙහි ස්වභාවය පිළිබඳ විස්තර කරයි. | 24 |
| | 2.3 සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග විග්‍රහ කරයි. | • සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග<br>- සන්නිවේදකයා (යවන්නා)<br>- සන්දේශය<br>- නාලිකාව<br>- ග්‍රාහකයා (ලබන්නා)<br>- බාධක<br>- ප්‍රතිපෝෂණය<br>- සන්දර්භය<br>- අත්දැකීම් පසුතලය<br>- බලපෑම් | • සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග පිළිබඳ වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරයි.<br>• සන්නිවේදන ක්‍රියාවලිය තේරුම් ගැනීමට මූලිකාංග පිළිබඳ අවබෝධය අවශ්‍ය බව තේරුම් ගෙන අදහස් දක්වයි. | 18 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.4 සන්නිවේදනය යනු කුමක් ද යන්න නිර්වචනය කරයි. | • සන්නිවේදනය පිළිබඳ නිර්වචන<br>1. විල්බර් ශ්‍රාම්<br>2. හැරල්ඩ් ලැස්වෙල්<br>3. ක්ලෝඩ් ෂැනොන් හා වොරන් වීවර් | • සන්නිවේදනය යනු කුමක් ද යන්න නිර්වචන ඇසුරින් පැහැදිලි කරයි. | 10 |
| | 2.5 සන්නිවේදනයේ මූලික කාර්යයන් පිළිබඳ අවබෝධයෙන් යුතු ව පැහැදිලි කරයි. | • සන්නිවේදනයේ කාර්ය<br>- තොරතුරු සම්පාදනය<br>- උපදෙස් සම්පාදනය<br>- පෙලඹවීම<br>- විනෝදාස්වාදය<br>- සුපරීක්ෂණය<br>- අර්ථකථනය<br>- සහසම්බන්ධය<br>- සමාජානුයෝජනය | • සන්නිවේදනයේ කාර්යභාරය පිළිබඳ නිදසුන් දක්වමින් පැහැදිලි කරයි. | 24 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 සන්නිවේදන වර්ග ස්වරූප හා ආකෘති පිළිබඳ න්‍යායාත්මක කරුණු අවබෝධ කර ගනිමින් ඒවා අවස්ථෝචිත ව භාවිත කරයි. | 3.1 සන්නිවේදන වර්ග පිළිබඳ අවබෝධ කර ගනිමින් අවස්ථානුකූල ව භාවිත කරයි. | **3. මූලික සන්නිවේදන වර්ග, ස්වරූප සහ ආකෘති**<br>• සන්නිවේදන වර්ග<br>- අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය<br>- අන්තර්පුද්ගල සන්නිවේදනය (පුද්ගලාන්තර සන්නිවේදනය)<br>- සමූහ සන්නිවේදනය<br>- මහජන සන්නිවේදනය<br>- ජනසන්නිවේදනය<br>- අතථ්‍ය සන්නිවේදනය | • සන්නිවේදන වර්ග නම් කරයි.<br>• සන්නිවේදන වර්ග වෙන් වෙන් වශයෙන් නම් කරයි.<br>• සන්නිවේදන වර්ග පිළිබඳ න්‍යායාත්මක කරුණු ප්‍රායෝගික ව භාවිත කිරීමෙන් සන්නිවේදනය සාර්ථක කර ගැනීමට හැකි වන බව පිළිගෙන කටයුතු කරයි.<br>• අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ ස්වභාවය හා ක්‍රියාවලිය විග්‍රහ කරයි.<br>• අන්තර්පුද්ගල සන්නිවේදනය යන්න පැහැදිලි කරයි.<br>• ආචාරශීලී ව අන්තර්පුද්ගල සන්නිවේදනයේ යෙදෙයි.<br>• වගකීම හා වගවීමෙන් යුතු ව සමූහ සන්නිවේදනයේ යෙදීමේ අවශ්‍යතාව හඳුනා ගනිමින් ඒ අනුව කටයුතු කරයි. | 30 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | | • සමූහ සන්නිවේදනයේ ස්වභාවය හා එහි විශේෂතා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br><br>• සමූහ සන්නිවේදනය යන්න හඳුනා ගනිමින් ඒ අනුව කටයුතු කරයි.<br><br>• මහජන සන්නිවේදනය යන්න පැහැදිලි කරයි.<br><br>• ජනසන්නිවේදනය යනු කුමක් දැ යි විග්‍රහ කරයි.<br><br>• අතර්‍ය සන්නිවේදනයේ ස්වභාවය හා ක්‍රියාවලිය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br><br>• සන්නිවේදන වර්ගයන්හි ප්‍රායෝගික අවශ්‍යතාව හා ඵලදායීත්වය විග්‍රහ කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.2 සන්නිවේදන ස්වරූප පිළිබඳ පැහැදිලි කරමින් භාවිතයේ දී යොදා ගනියි. | • සන්නිවේදන ස්වරූප<br>- වාචික/නිර්වාචික<br>- කථන/රූපන<br>- ලිඛිත/ශ්‍රව්‍ය/දෘශ්‍ය/කථන<br>- විධිමත්/අවිධිමත් | • විවිධ සන්නිවේදන ස්වරූප හඳුන්වා දෙයි.<br>• සන්නිවේදන ස්වරූප භාවිත වන ආකාරය නිදසුන් දක්වමින් පැහැදිලි කරයි.<br>• විවිධ සන්නිවේදන ස්වරූප පිළිබඳ අවබෝධයෙන් ඉදිරිපත් කිරීම් කරයි. | 10 |
| | 3.3 සන්නිවේදන ආකෘති පිළිබඳ න්‍යායාත්මක කරුණු අවබෝධයෙන් යුතු ව විග්‍රහ කරයි. | • සන්නිවේදන ආකෘති<br>- හැඳින්වීම<br>- මූලික සන්නිවේදන ආකෘති<br>1. ඇරිස්ටෝටලියානු ආකෘතිය<br>2. ලැස්වෙල් ආකෘතිය<br>3. ක්ලෝඩ් ෂැනොන් හා වොරන් වීවර් ආකෘතිය | • සන්නිවේදන ආකෘති හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• සන්නිවේදන ක්‍රියාවලිය සිදු වන ආකාරය පිළිබඳ ආකෘති ඇසුරින් පැහැදිලි කරයි. | 24 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 සාම්ප්‍රදායික මාධ්‍ය ජනමාධ්‍ය හා නව මාධ්‍ය පිළිබඳ අර්ථ-කථනය කරමින් හා ඒවායේ සුවිශේෂතා අධ්‍යයනය කරමින් විවිධ සන්නිවේදන කාර්යයන්හි දී ප්‍රායෝගික ව භාවිත කරයි. | 4.1 සාම්ප්‍රදායික මාධ්‍ය යනු කුමක් ද යි අර්ථකථනය කරමින් එහි සුවිශේෂතා පැහැදිලි කරයි. | **4. සාම්ප්‍රදායික මාධ්‍ය හා ජනමාධ්‍ය, නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය**<br><br>• සාම්ප්‍රදායික මාධ්‍ය හැඳින්වීම සහ විශේෂතා | • සාම්ප්‍රදායික මාධ්‍ය යනු කුමක් ද යි අර්ථ කථනය කරයි.<br>• සාම්ප්‍රදායික මාධ්‍ය විධික්‍රම නම් කර පැහැදිලි කරයි.<br>• සාම්ප්‍රදායික මාධ්‍යවල වැදගත්කම විස්තර කරයි. | 08 |
| | 4.2 විවිධ ජනමාධ්‍ය ප්‍රභේද හඳුනා ගනිමින් ඒවායේ විශේෂතා අවබෝධයෙන් යුතු ව විග්‍රහ කරයි. | • ජනමාධ්‍ය හැඳින්වීම සහ විශේෂතා<br>• ජනසන්නිවේදන ආකෘති<br>- HUB ආකෘතිය | • ජනමාධ්‍ය යනු කුමක් ද යන්න අර්ථකථනය කරයි.<br>• ජනමාධ්‍යයේ සුවිශේෂතා විස්තර කරයි.<br>• ජනසන්නිවේදන ආකෘති නිදසුන් සහිත ව පැහැදිලි කරයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.3 නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය හඳුනා ගනිමින් ඒවාහි සමාජ කාර්යභාරය පැහැදිලි කරයි. | • නව මාධ්‍ය හැඳින්වීම සහ විශේෂතා<br><br>• සමාජ මාධ්‍ය හැඳින්වීම සහ විශේෂතා | • නව මාධ්‍ය යන්න හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br><br>• නව මාධ්‍යයන්ගේ කාර්යභාරය පැහැදිලි කරයි.<br><br>• සමාජ මාධ්‍ය යනු කුමක් ද යන්න පැහැදිලි කරයි.<br><br>• සමාජ මාධ්‍යයන්ගේ කාර්යභාරය විස්තර කරයි. | 10 |
| | 4.4 නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය භාවිත කුසලතා ප්‍රදර්ශනය කරයි. | • නව මාධ්‍ය හැකියා, කුසලතා හා භාවිතය<br><br>• සමාජ මාධ්‍ය හැකියා, කුසලතා හා භාවිතය | • නව මාධ්‍ය හැකියා සහ කුසලතා භාවිත කරමින් සන්දේශ සකස් කර ඉදිරිපත් කරයි.<br><br>• සමාජ මාධ්‍ය හැකියා සහ කුසලතා භාවිත කරමින් සන්දේශ සකස් කර ඉදිරිපත් කරයි. | 12 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 සංස්කෘතිය යන්න අවබෝධ කර ගනිමින් මාධ්‍ය ක්‍රියාකාරිත්වය හේතුවෙන් සංස්කෘතියේ ඇති වූ වෙනස් වීම් හා බලපෑම පිළිබඳ දැනුවත් ව විචාරශීලී ව කටයුතු කරයි. | 5.1 සංස්කෘතිය, එහි ස්වභාවය හා විශේෂතා අවබෝධයෙන් යුතු ව පැහැදිලි කරයි. | **5. සංස්කෘතිකාවබෝධය, මාධ්‍යයේ ස්වභාවය සහ එහි බලපෑම**<br><br>• හැඳින්වීම<br>- සංස්කෘතිය යනු කුමක් ද?<br>- සංස්කෘතියේ ස්වභාවය හා විශේෂතා | • සංස්කෘතිය යන්න පැහැදිලි කරයි.<br>• සංස්කෘතියේ ස්වභාවය හා විශේෂතා පිළිබඳ අවබෝධයෙන් යුතු ව විස්තර කරයි. | 08 |
| | 5.2 සංස්කෘති අධ්‍යයනයෙන් සංස්කෘති අතර ඇති විවිධතා හඳුනා ගෙන සංසන්දනාත්මක ව පැහැදිලි කරයි. | • සංස්කෘති අධ්‍යයනය<br>- සාම්ප්‍රදායික සංස්කෘතිය<br>- ජන සංස්කෘතිය<br>- මාධ්‍ය සංස්කෘතිය<br>- ජනප්‍රිය සංස්කෘතිය<br>- ගෝලීය සංස්කෘතිය<br>- අන්තර් සංස්කෘතික අධ්‍යයනය | • මාධ්‍යයේ වර්ධනයත් සමඟ සංස්කෘතිය වෙනස් වූ ආකාරය පැහැදිලි කරයි.<br>• මෙම සංස්කෘතිවල විවිධතා හා විශේෂතා පිළිබඳ වෙන් වෙන් වශයෙන් විස්තර කරයි. | 24 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 5.3 සංස්කෘතිය කෙරෙහි ජනමාධ්‍යයන්ගේ බලපෑම පිළිබඳ විශ්ලේෂණාත්මක ව කරුණු දක්වයි. | • මාධ්‍ය බලපෑම<br>- හැඳින්වීම<br>- න්‍යායාත්මක පදනම<br><br>• මාධ්‍යයෙහි සංස්කෘතික බලපෑම<br>- ආකල්ප<br>- හැසිරීම<br>- ප්‍රචණ්ඩත්වය<br>- සංස්කෘති කම්පනය<br>- ලෝලත්වය | • මාධ්‍ය බලපෑම යන්න හඳුන්වා දෙයි.<br><br>• මාධ්‍ය මඟින් සංස්කෘතිය කෙරෙහි ඇති කරනු ලබන බලපෑම විචාරාත්මක ව පැහැදිලි කරයි. | 12 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 ජනමාධ්‍ය මඟින් ඉදිරිපත් වන අසීමාන්තික තොරතුරු සමුදාය අතුරෙන් සාමාජීය සත්ත්වයෙකු ලෙස තමාට අවශ්‍ය තොරතුරු තෝරා බේරා ගනිමින් විචාරශීලී ව මාධ්‍ය පරිහරණය කිරීමටත් මාධ්‍ය සාක්ෂරතා දැනුම ජීවිතයට ආදේශ කර ගැනීමටත් ක්‍රියා කරයි. | 6.1 මාධ්‍ය සාක්ෂරතාව යන්න පිළිබඳ අවබෝධයෙන් යුතු ව මාධ්‍ය සාක්ෂරතා මූලිකාංග විග්‍රහ කරයි. | **6. මාධ්‍ය සාක්ෂරතාව හා මාධ්‍ය විචාරය**<br><br>● මාධ්‍ය සාක්ෂරතාව<br>- හැඳින්වීම<br>- සාක්ෂරතාව යනු කුමක් ද?<br>- මාධ්‍ය සාක්ෂරතාව<br>- මාධ්‍ය සාක්ෂරතාව නිර්වචන<br>- මාධ්‍ය සාක්ෂරතා මූලිකාංග<br><br>i. මාධ්‍ය සන්දේශ ක්‍රියාවලිය හඳුනා ගැනීමේ හැකියාව<br>ii. මාධ්‍ය සන්දේශයන්හි බලපෑම හඳුනා ගැනීමේ හැකියාව<br>iii. මාධ්‍ය සන්දේශ විශ්ලේෂණය කිරීමේ හා ඒ සම්බන්ධ කතිකාවතක් ගොඩනැගීමේ හැකියාව<br>iv. මාධ්‍ය සන්දේශය සංජානනය කිරීමේ හැකියාව<br>v. මාධ්‍ය සන්දේශය ඇගයීමේ හැකියාව<br>vi. සමස්ත මාධ්‍ය සන්දේශයෙහි පාඨාන්තර අවබෝධ ලබා ගැනීමේ හැකියාව | ● සාක්ෂරතාව යන්න හඳුන්වා දෙයි.<br>● මාධ්‍ය සාක්ෂරතාව යනු කුමක් දැ යි නිර්වචන ඇසුරින් පැහැදිලි කරයි.<br>● මාධ්‍ය සාක්ෂරතා මූලිකාංග පිළිබඳ අවබෝධයෙන් යුතු ව පැහැදිලි කරයි.<br>● මාධ්‍ය සාක්ෂරතාවෙහි වැදගත්කම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ අවබෝධය ප්‍රායෝගික ව භාවිත කරයි. | 30 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.2 මාධ්‍ය විචාරය හා එයට සම්බන්ධ විවිධාංග හඳුනා ගෙන විචාරශීලී ග්‍රාහකත්වය පැහැදිලි කරයි. | • මාධ්‍ය විචාරය<br>- හැඳින්වීම<br>- මාධ්‍ය විචාරය යනු කුමක් ද?<br>1. මාධ්‍ය සහ දෛනික ජීවිතය<br>2. මාධ්‍ය සහ විවිධ දෘෂ්ටිවාද<br>3. මාධ්‍ය සහ සන්දේශයන්හි සම විසමතා<br>4. මාධ්‍ය සන්දේශ ආධිපත්‍ය<br>5. මාධ්‍ය ආර්ථිකය<br>6. මාධ්‍ය හා තාක්ෂණය<br>7. මාධ්‍ය හා සංස්කෘතිය<br>8. මාධ්‍ය හා මායාව<br><br>• විචාරශීලී ග්‍රාහකයා | • මාධ්‍ය විචාරය යන්න හඳුන්වා දෙයි.<br>• මාධ්‍ය විචාරයේ අවශ්‍යතාව විස්තර කරයි.<br>• මාධ්‍ය විචාරයට සම්බන්ධ විවිධ අංග විස්තර කරයි.<br>• තෝරාගත් මාධ්‍ය සංදේශයක් විචාරයට ලක් කරයි.<br>• විචාරශීලී ග්‍රාහකයා යන්න හඳුන්වා දෙයි.<br>• විචාරශීලී ග්‍රාහකයෙකු සතු ගුණාංග අවබෝධයෙන් යුතු ව පැහැදිලි කරයි. | 24 |
| | 6.3 මාධ්‍ය සන්දේශ විශ්ලේෂණය පිළිබඳ අවබෝධයෙන් යුතු ව විචාරශීලී ව කටයුතු කරයි. | • මාධ්‍ය සන්දේශය විශ්ලේෂණය කිරීම<br>- අර්ථය - Meaning<br>- අදාළ බව -Appropriateness<br>- පෙලඹවීම - Motivation<br>- පක්ෂපාතිත්වය - Bias<br>- විශ්වසනීයත්වය- Credibility<br>- විකෘතිකරණය - Distortion<br>- සඵලතාව - Effectiveness<br>- ශූර මෙහෙයවීම - Manipulation<br>- ඒකාකාරි බව - Stereotyped<br>- ඇගයීම - Evaluation | • මාධ්‍ය සන්දේශයක් විශ්ලේෂණය කිරීමේ මූලික කරුණු හඳුන්වා දෙයි.<br>• තෝරාගත් මාධ්‍ය සන්දේශයක් විශ්ලේෂණය කරයි. | 22 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 නිර්මාණාත්මක සන්නිවේදනය, එහි මූලිකාංග හා වැදගත්කම පිළිබඳ අවබෝධයෙන් යුතු ව විවිධ මාධ්‍යයන් සඳහා සන්දේශකරණයේ දී අවස්ථෝචිත ව යොදා ගනියි. | | **7. නිර්මාණාත්මක සන්නිවේදනය** | | |
| | 7.1 නිර්මාණාත්මක සන්නිවේදනය වඩාත් ප්‍රතිඵලදායී සන්නිවේදන ක්‍රමෝපායක් බව පැහැදිලි කරයි. | • හැඳින්වීම<br>- නිර්මාණාත්මක සන්නිවේදනයේ ස්වභාවය<br>- අවශ්‍යතාව හා වැදගත්කම | • නිර්මාණාත්මක සන්නිවේදනය යන්න හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• නිර්මාණාත්මක සන්නිවේදනයේ අවශ්‍යතාව හා වැදගත්කම පැහැදිලි කරයි. | 16 |
| | 7.2 නිර්මාණශීලීත්වයේ මූලිකාංග හඳුනා ගෙන අවස්ථානුකූල ව භාවිත කරයි. | • නිර්මාණශීලීත්වයේ මූලිකාංග<br>i. නිර්මාණය /නිර්මාණශීලීත්වය<br>ii. නිර්මාණාත්මක චින්තනය<br>iii. නිර්මාණ ශිල්පියා<br>iv. නිර්මාණාත්මක රචනය | • නිර්මාණශීලීත්වයේ මූලිකාංග හඳුනා ගෙන අවබෝධයෙන් යුතු ව විස්තර කරයි.<br>• අවස්ථානුකූල ව විවිධ මාධ්‍ය සඳහා නිර්මාණාත්මක සන්දේශ ඉදිරිපත් කරයි. | 24 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 7.3 නිර්මාණශීලී භාෂා භාවිතය හා විවිධ ප්‍රකාශන මාධ්‍යවල නිර්මාණශීලීත්වය හඳුනා ගෙන පැහැදිලි කරයි. | • සන්නිවේදනය හා නිර්මාණශීලීත්වය<br>- නිර්මාණශීලී භාෂා භාවිතය<br>- මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය නිර්මාණශීලීත්වය<br>- සිනමාව හා නිර්මාණශීලීත්වය<br>- නිර්මාණශීලී රංග කලා භාවිතය | • සන්නිවේදනය සඳහා නිර්මාණශීලී ව භාෂාව භාවිත කළ හැකි බව පැහැදිලි කරයි.<br>• නිර්මාණශීලී ව භාෂාව භාවිත කරමින් විවිධ මාධ්‍ය සඳහා සන්දේශ සකස් කරයි. | 10 |
| | 7.4 සන්දේශයක් නිර්මාණශීලී ව ගොඩනැගීමට ජනශ්‍රැතිය හා ජන කලා භාවිත කළ හැකි බව අවබෝධයෙන් යුතු ව පැහැදිලි කරමින් විවිධ මාධ්‍ය සඳහා නිර්මාණාත්මක සන්දේශ සකස් කරයි. | • ජනශ්‍රැතිය හා ජන කලා පිළිබඳ නිර්මාණාත්මක සන්නිවේදන අවබෝධය | • ජනශ්‍රැතිය හා ජන කලා සන්නිවේදන කාර්යයේ දී නිර්මාණශීලී ව භාවිත කළ හැකි බව හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• අවස්ථෝචිත ව නිර්මාණශීලී ව ජනශ්‍රැතිකාංග හා ජන කලා සිය කාර්යයන්හි දී යොදා ගනියි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 මහජන සම්බන්ධතා හා සිද්ධි කළමනාකරණ ප්‍රායෝගික විෂය ක්ෂේත්‍රයක් බව අවබෝධයෙන් යුතු ව සිය ජීවිත කාර්යයන්හි දී ප්‍රායෝගික ව භාවිත කරයි. | 8.1 මහජන සම්බන්ධතාවෙහි ආරම්භය එහි වැදගත්කම හා අවශ්‍යතාව විග්‍රහ කරයි. | **8. මහජන සම්බන්ධතා හා සිද්ධි කළමනාකරණය**<br>• හැඳින්වීම<br>- මහජන සම්බන්ධතාව ආරම්භක පසුබිම<br>- අවශ්‍යතාව හා වැදගත්කම | • මහජන සම්බන්ධතාව යන්න ආරම්භ වීමට බලපෑ කරුණු විස්තර කරයි.<br>• මහජන සම්බන්ධතාවේ වැදගත්කම හා අවශ්‍යතාව පැහැදිලි කරයි. | 04 |
| | 8.2 මහජන සම්බන්ධතා නිර්වචනය කරයි. | • මහජන සම්බන්ධතා නිර්වචන | • මහජන සම්බන්ධතා යන්න නිර්වචනය කරයි. | 04 |
| | 8.3 මහජන සම්බන්ධතා අවස්ථා පිළිබඳ අවබෝධයෙන් යුතු ව විස්තර කරයි. | • මහජන සම්බන්ධතා අවස්ථා<br>- රාජ්‍ය මහජන සම්බන්ධතා<br>- ආයතනික මහජන සම්බන්ධතා<br>- වෘත්තීය මහජන සම්බන්ධතා<br>- ව්‍යාපාර හා මහජන සම්බන්ධතා<br>- මාධ්‍ය හා මහජන සම්බන්ධතා | • මහජන සම්බන්ධතා අවස්ථා නිදසුන් දක්වමින් පැහැදිලි කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.4 මහජන සම්බන්ධතා මෙවලම් හා විධි ක්‍රම හඳුනා ගෙන භාවිත කරයි. | • මහජන සම්බන්ධතා මෙවලම් හා විධික්‍රම<br>• මහජන සම්බන්ධතා මෙවලම් හා විධි ක්‍රම | • මහජන සම්බන්ධතා මෙවලම් හා විධි ක්‍රම වෙන් වෙන් වශයෙන් හඳුනා ගෙන විස්ර කරයි.<br>• අවශ්‍ය අවස්ථාවන්වල දී මහජන සම්බන්ධතා විධික්‍රම හා මෙවලම් භාවිත කරයි. | 06 |
| | 8.5 මහජන සම්බන්ධතා නිලධාරියා ඔහුගේ කාර්යභාරය පිළිබඳ අවබෝධයෙන් යුතුව විස්තර කරයි. | • මහජන සම්බන්ධතා නිලධාරියාගේ කාර්යභාරය<br>• මාධ්‍ය නිලධාරියා සහ මහජන සම්බන්ධතාව | • මහජන සම්බන්ධතා නිලධාරියා හා ඔහුගේ කාර්ය පිළිබඳ විමර්ශනාත්මක අදහස් දක්වයි.<br>• මාධ්‍ය නිලධාරියාගේ මහජන සම්බන්ධතා කාර්යභාරය විස්තර කරයි. | 06 |
| | 8.6 සිද්ධි කළමනාකරණය අර්ථකථනය කරයි. | • සිද්ධි කළමනාකරණය<br>- හැඳින්වීම<br>- නිර්වචන<br>- අවශ්‍යතාව හා වැදගත්කම | • සිද්ධි කළමනාකරණය යනු කුමක් ද යන්න හඳුනා ගෙන විස්තර කරයි.<br>• සිද්ධි කළමනාකරණයෙහි අවශ්‍යතාව හා වැදගත්කම විස්තර කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 8.7 සිද්ධි කළමනාකරණයේ අවස්ථා හඳුනා ගෙන සිද්ධි කළමනාකරණය කිරීමේ ප්‍රායෝගික හුරුව ලබයි. | • සිද්ධි කළමනාකරණයේ අවස්ථා<br>- අවස්ථාව හඳුනා ගැනීම<br>- සිද්ධි කළමනාකරණයේ භූමිකාව<br>- සැලැස්ම<br>- ක්‍රමවේදය<br>- කාර්ය සාධන පටිපාටිය<br>- අනුග්‍රාහකත්වය | • සිද්ධි කළමනාකරණය යනු කුමක් ද යි හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• සිද්ධි කළමනාකරණ අවස්ථා පිළිබඳ අවබෝධයෙන් යුතු ව සිද්ධි කළමනාකරණ සැලසුමක් සකස් කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 සංවර්ධනය සඳහා සන්නිවේදනය භාවිත කිරීම ආරම්භය, විකාශය, අවශ්‍යතාව හා නව ප්‍රවණතා හඳුනා ගෙන ඊට අනුගත ව දැනුම ආකල්ප චර්යා සකස් විය යුතු ආකාරය පිළිබඳ අවබෝධයෙන් යුතු ව සංවර්ධන සන්දේශ නිර්මාණය කිරීමේ හුරුව ලබයි. | 9.1 සංවර්ධනය හා සංවර්ධනය පිළිබඳ මතවාද විග්‍රහ කරයි. | 9. සංවර්ධනය සඳහා සන්නිවේදනය<br>● හැඳින්වීම<br>- සංවර්ධනය නිර්වචන, ආරම්භය හා විකාශය<br>- සංවර්ධනය සංකල්පය පිළිබඳ මතවාද<br>- සංවර්ධන සංකල්පයේ නව ප්‍රවණතා | • සංවර්ධන සංකල්පය අර්ථකථනය කරයි.<br>• සංවර්ධන සංකල්පයේ ඓතිහාසික විකාශය පැහැදිලි කරයි.<br>• සංවර්ධනය පිළිබඳ මතවාද සංසන්දනාත්මක ව හදාරයි.<br>• සංවර්ධන සංකල්පයේ නව ප්‍රවණතා හඳුන්වා දෙයි. | 10 |
| | 9.2 සංවර්ධනය සංකල්පයේ නූතන ස්වභාවයන් හඳුනා ගෙන පැහැදිලි කරයි. | ● සංවර්ධන සංකල්පයේ ස්වභාවය<br>- ජනතා කේන්ද්‍රීයතාව<br>- ප්‍රදේශීයකරණය<br>- සමාජීය සම්බන්ධතා හා සමානත්වයන් ගොඩනැඟීම<br>- දරිද්‍රතාව අවම කිරීම<br>- ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ජනතා මැදිහත් වීම | • සංවර්ධන සංකල්පයේ ස්වභාවය පිළිබඳ අවබෝධයෙන් යුතු ව පැහැදිලි කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.3 සංවර්ධන සඳහා සන්නිවේදන අවශ්‍යතා විචාරශීලී ව පැහැදිලි කරයි. | • සංවර්ධනය සඳහා සන්නිවේදන අවශ්‍යතා<br>- මාධ්‍ය ගුණාත්මක කිරීම<br>- සහභාගිත්වය හා අන්තර්පුද්ගල සම්බන්ධතා ශක්තිමත් කිරීම<br>- අත්‍යවශ්‍ය මානුෂීය තොරතුරු සම්පාදනය<br>- ප්‍රතිසංස්කරණයන්ට මැදිහත් වීම<br>- ධරණීය සංවර්ධනය | • සංවර්ධන සඳහා සන්නිවේදන අවශ්‍යතා පිළිබඳ අවබෝධයෙන් යුතු ව පැහැදිලි කරයි. | 10 |
| | 9.4 සංවර්ධනය සඳහා සන්නිවේදන අපේක්ෂා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | • සංවර්ධනය සඳහා සන්නිවේදන අපේක්ෂා<br>- අවශ්‍යතා කේන්ද්‍රීයත්වය<br>- ස්වයං නිර්ණය<br>- ස්වයං විශ්වාසය<br>- යහපත් පරිසරයක් ගොඩනැගීම<br>- සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය | • සංවර්ධනය සඳහා සන්නිවේදන අපේක්ෂා පිළිබඳ විචාරාත්මක ව කරුණු ඉදිරිපත් කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10.0 මාධ්‍ය ප්‍රතිපත්ති මාධ්‍ය නියාමනය, ජනමාධ්‍ය ආචාරධර්ම හා මාර්ගෝපදේශ මඟින් මාධ්‍ය සීමාවන් පෙන්වා දී ඇති බව අවබෝධ කර ගනිමින් විචාරශීලී ව කටයුතු කරයි. | 10.1 සන්නිවේදන ප්‍රතිපත්ති පිළිබඳ අවබෝධයෙන් යුතු ව පැහැදිලි කරයි. | **10. සන්නිවේදන ප්‍රතිපත්ති හා මාධ්‍ය නියාමනය**<br>• සන්නිවේදන ප්‍රතිපත්ති<br>- හැඳින්වීම<br>- මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය<br>- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව<br>- ජනමාධ්‍ය නිදහස<br>- බුද්ධිමය දේපළ පනත/හිමිකම්<br>- තොරතුරු දැන ගැනීමේ පනත/ තොරතුරු දැන ගැනීමේ අයිතිය | • සන්නිවේදන ප්‍රතිපත්ති යන්න හඳුන්වා දෙයි.<br>• භාෂණය හා ලේඛනය පිළිබඳ මූලික අයිතිවාසිකම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති බව අවබෝධයෙන් යුතු ව පැහැදිලි කරයි.<br>• මාධ්‍ය නිදහස අර්ථකථනය කරයි.<br>• මාධ්‍ය නිදහස පිළිබඳ විචාරශීලී ව අදහස් දක්වයි.<br>• බුද්ධිමය දේපළ පනත පිළිබඳ විස්තර කරයි.<br>• තොරතුරු දැන ගැනීමේ අයිතිය හා එහි වැදගත්කම විග්‍රහ කරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.2 මාධ්‍ය නියාමනය අර්ථකථනය කරමින් එහි අවශ්‍යතාව, විශේෂතා, නියාමන ආයතන හා ඒවායේ කාර්යභාරය පිළිබඳ විග්‍රහ කරයි. | • මාධ්‍ය නියාමනය<br>- හැඳින්වීම<br>- මාධ්‍ය නියාමනයේ ඉතිහාසය<br>- අවශ්‍යතාව<br>- නියාමන වර්ග<br>- මාධ්‍ය වාරණය<br>- නියාමන ආයතන කිහිපයක් හා ඒවායේ කාර්යභාරය<br>⋆ ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය<br>⋆ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය<br>⋆ ශ්‍රී ලංකා විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාව<br>⋆ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම<br>⋆ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT) | • මාධ්‍ය නියාමනය යන්න හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• මාධ්‍ය නියාමනය පිළිබඳ ඉතිහාසය විස්තර කරයි.<br>• මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාව හා එහි විශේෂතා හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• මාධ්‍ය වාරණය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.<br>• මාධ්‍ය නියාමන ආයතන කිහිපයක් නම් කරයි.<br>• මාධ්‍ය නියාමන ආයතන කිහිපයක කාර්යය පැහැදිලි කරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.3 විවිධ මාධ්‍ය සඳහා ජනමාධ්‍ය ආචාරධර්ම හා මාර්ගෝපදේශ තිබෙන බව හඳුනා ගෙන ඒවායේ අවශ්‍යතාව පිළිබඳ අදහස් දක්වයි. | • මාධ්‍ය ආචාරධර්ම හා මාර්ගෝපදේශ<br>- පුවත්පත<br>- ගුවන්විදුලිය<br>- සිනමා හා රංග කලා<br>- රූපවාහිනිය<br>- නව මාධ්‍ය | • මාධ්‍ය ආචාරධර්ම පිළිබඳ පැහැදිලි කරයි.<br>• මාධ්‍ය මාර්ගෝපදේශ යන්න හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• මාධ්‍ය මාර්ගෝපදේශවල අවශ්‍යතාව පිළිබඳ විචාරාත්මක ව අදහස් දක්වයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 11.0 ශ්‍රී ලංකාවේ මාධ්‍ය ව්‍යාප්තිය හා මාධ්‍ය ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | | **11. සමකාලීන මාධ්‍ය ප්‍රවණතා** | | |
| | 11.1 ශ්‍රී ලංකාවේ වර්තමාන මාධ්‍ය ව්‍යාප්තිය පිළිබඳ හඳුනා ගෙන අදහස් දක්වයි. | • ශ්‍රී ලංකාවේ මාධ්‍ය පිළිබඳ හැඳින්වීම | • ශ්‍රී ලංකාවේ මාධ්‍ය ව්‍යාප්තිය පිළිබඳ විධිමත් දත්ත සටහනක් සකස් කරයි.<br>• ශ්‍රී ලංකාවේ මාධ්‍ය ව්‍යාප්තිය පිළිබඳ පැහැදිලි කරයි. | 12 |
| | 11.2 සමකාලීන මාධ්‍ය ප්‍රවණතා පිළිබඳ විග්‍රහ කරයි. | • මාධ්‍ය ප්‍රවණතා<br>- මාධ්‍ය අභිසරණතාව<br>- නිර්මහාපරිමාණකරණය<br>- නිර්නියාමනය<br>- පරිභෝජ්‍යකරණය<br>- භාණ්ඩකරණය<br>- වාණිජකරණය<br>- ගෝලීයකරණය | • මාධ්‍ය ප්‍රවණතා පිළිබඳ පැහැදිලි කරයි.<br>• ප්‍රවණතා සංකල්ප නිදසුන් දක්වමින් පැහැදිලි කරයි | 12 |
| | 11.3 ශ්‍රී ලංකාවට විශේෂිත ව මාධ්‍ය ප්‍රවණතා හඳුනා ගෙන පැහැදිලි කරයි. | • මාධ්‍ය ප්‍රවණතා ශ්‍රී ලංකාවට විශේෂිත ව<br>- තාක්ෂණික<br>- ආයතනික<br>- අන්තර්ගතය<br>- ග්‍රාහකයා | • මාධ්‍ය ප්‍රවණතා සංකල්ප පිළිබඳ ශ්‍රී ලංකාවට විශේෂිත ව කරුණු ඉදිරිපත් කරයි. | 12 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| 12.0 සමීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ ක්‍රමවත් ව අධ්‍යයනය කර ඉන් ලැබෙන ශික්ෂණය ජීවිතයට ආදේශ කර ගනියි. | 12.1 සන්නිවේදනය හා මාධ්‍ය සමීක්ෂණ පිළිබඳ අර්ථකථනය කරයි. | **12. සන්නිවේදන සමීක්ෂණ**<br>• හැඳින්වීම<br>- සන්නිවේදන හා මාධ්‍ය සමීක්‍ෂණ<br>- සමීක්ෂණ<br>- සමීක්ෂණ ක්‍රමවේද<br>- සමීක්ෂණ ක්‍රම (වර්ග)<br>- සමීක්ෂණ භාවිතයේ වාසි හා අවාසි | • සමීක්ෂණය යන්න අර්ථකථනය කරයි.<br>• මාධ්‍ය සමීක්ෂණ අර්ථය විග්‍රහ කරයි.<br>• සමීක්ෂණයෙහි වාසි අවාසි විස්තර කරයි. | 16 |
| | 12.2 සන්නිවේදන සමීක්‍ෂණ ක්‍රියාවලිය අනුගමනය කරමින් සරල සමීක්‍ෂණයක් සිදු කරයි. | • සන්නිවේදන සමීක්ෂණ ක්‍රියාවලිය<br>- හැඳින්වීම<br>- ගැටලුව හඳුනා ගැනීම<br>- අරමුණු<br>- සමීක්‍ෂණ ක්‍රමය තෝරා ගැනීම<br>- දත්ත රැස් කිරීම<br>- දත්ත විශ්ලේෂණය<br>- නිගමනවලට එළඹීම<br>- වාර්තාව සම්පාදනය සහ ඉදිරිපත් කිරීම | • සමීක්ෂණයක පියවර පිළිවෙළින් දක්වයි.<br>• සමීක්ෂණ පියවර අනුගමනය කරමින් සමීක්ෂණයක් සිදු කරයි. | 18 |

## පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

සන්නිවේදන අධ්‍යයනය පුද්ගල ජීවිතයට වඩාත් සමීප සජීව හා ප්‍රායෝගික විෂය ක්ෂේත්‍රයකි. මෙම විෂය නිර්දේශයෙහි ඇතුළත් විෂය කරුණු හදරන ශිෂ්‍යයාගේ ජීවන චරිතයෙන් යහපත් සන්නිවේදකයෙකුගේ ගති ලක්ෂණ සමාජයට දක ගැනීමට/ප්‍රදර්ශනය කිරීමට සැලැස්විය යුතු ය. ඒ සඳහා පාසල් මට්ටමට ගැළපෙන අයුරින් ප්‍රායෝගික ඉගෙනුම් ක්‍රියාකාරකම් සම්පාදනය කර ගැනීමට ගුරු භවතා ක්‍රියා කළ යුතු වේ. පහත සඳහන් ක්‍රියාකාරකම් ඒ සඳහා උපකාර වනු ඇත.

- පාසල් මට්ටමෙන් මාධ්‍ය සමාජ පිහිටුවා ගැනීම
- ශිෂ්‍යයන් එම මාධ්‍ය සමාජවල සක්‍රිය සාමාජිකයන් ලෙස කාර්යයන්හි නිරත කරවීම
- මාධ්‍ය දින/මාධ්‍ය සතිය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- බිත්ති පුවත්පතක්, වාර්ෂික ප්‍රකාශනයක් එළි දක්වීම වැනි ක්‍රියාකාරකම් සිදු කිරීම
- සන්නිවේදන ක්ෂේත්‍රයෙහි විද්වතුන්, ආයතන සම්බන්ධ කරගනිමින්
  - දේශන
  - වැඩමුළු
  - සාකච්ඡා
  - ගවේෂණ
  - ගවේෂණාත්මක අධ්‍යයන
  - ක්ෂේත්‍ර චාරිකා ආදිය සිදු කිරීම
- සරල තොරතුරු ගවේෂණය, වාර්තා සැපයීම ආදි ක්‍රියාකාරකම් පැවරීම
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් පැවරීම

උදා: බ්ලොග් අඩවි නිර්මාණය

කෙටි, සරල වාර්තා වැඩසටහන්

පටිගත කිරීම් (ගුවන් විදුලි/රූපවාහිනී)

ලිපි ලේඛන සම්පාදනයට ශිෂ්‍යයා යොමු කිරීම හා සුදුසු පරිදි ඇගයීමට ලක් කිරීම

## ඇගයීම හා තක්සේරුකරණය

මෙම විෂය නිර්දේශය පදනම් කර ගනිමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගය ජාතික මට්ටමේ ඇගයීම යි.

පාසල් මට්ටමෙන් පවත්වනු ලබන වාර අවසාන හා වර්ෂ අවසාන විභාග ක්‍රමයක් පාසල විසින් උචිත පරිදි සැලසුම් කර ගත යුතු ය.

පාසල පදනම් කර ගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ සහ වාරානුකූල ව නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම්වලට අදාළ ව පන්ති කාමර මට්ටමෙන් ඇගයීම් සැලසුම් කර ගත යුතු ය. ගුරු මාර්ගෝපදේශය මඟින් මේ සඳහා මූලික මඟ පෙන්වීමක් කර ඇත. ගුරු භවතුන්ගේ නිර්මාණශීලී හැකියා භාවිත කර ගනිමින් මෙම ඇගයීම් ක්‍රම තව දුරටත් සංවර්ධනය කර ගත හැකි ය.

## විෂය නිර්දේශ සම්පාදක මණ්ඩලය

### ලේඛක මණ්ඩලය (අභ්‍යන්තර)

| | | |
|---|---|---|
| එම්. ආර්. ඩබ්. මද්දුම මයා | අධ්‍යක්ෂ | සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම |
| පී. ටී. එම්. රත්නායක මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම |
| ආචාර්ය වාවින්නේ පඤ්ඤානන්ද හිමි | සහකාර කථිකාචාර්ය | සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම |

### ලේඛක මණ්ඩලය (බාහිර)

| | | |
|---|---|---|
| මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර මයා | සම්මානිත මහාචාර්ය | කැලණිය විශ්වවිද්‍යාලය |
| ආචාර්ය මහීම් මෙන්ඩිස් මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය ආරියරත්න ඇතුගල මයා | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | කැලණිය විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය කමල් වලේබොඩ මයා | මහාචාර්ය | කොළඹ විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය තියොඩෝර් ප්‍රනාන්දු මයා | මහාචාර්ය | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| ආචාර්ය ටියුඩර් වීරසිංහ මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය |
| ආචාර්ය එස්. රගුරාම් මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | යාපනය විශ්වවිද්‍යාලය |
| එම්. ඒ. එස්. හරිශ්චන්ද්‍ර මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| මිහිරි කුමාරගේ මිය | ගුරු සේවය | දොන් පේද්‍රික් මහා විද්‍යාලය, හොරණ |
| ප්‍රසන්න විමලසූරිය මයා | ගුරු සේවය | දොඩම්ගොල්ල මහා විද්‍යාලය, බිබිල |
| ඉන්දීවරී ජයසේකර මිය | ගුරු සේවය | ආනන්ද බාලිකා විද්‍යාලය, කෝට්ටේ |